**සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම - 2017**

**-----------------------------------------------------**

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත්පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එමඅවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

(අ) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.1,425,160,007 ක් වටිනා දේපළ පිරියත හා උපකරණ සමාගම විසින් භාවිතා කලද එම වත්කම් වල ඵලදායී ආර්ථික ජීවිත කාලය සමාලෝචනය කර ප්‍රත්‍යාගණනය කර අවශ්‍ය ගැලපුම් සිදුකර නොතිබුණි.

(ආ) විලම්භිත බදු වත්කම් /වගකීම් ගණනය කිරීමේදී 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 හි 46 සහ 47 ඡේද අනුව ගිණුම්කරණ කාලච්ඡේදය අවසානයේ පනවා ඇති බදු අනුපාතය යොදාගත යුතුය. එහෙත් සමාගම විසින් සියයට 28 ක බදු අනුපාතය වෙනුවට සියයට 12 ක බදු අනුපාතය යොදා ගැනීම නිසා සමාලෝචිත වර්ෂයේදී විලම්භිත බදු වියදම රු.295,600,375 ක් අඩුවෙන් ගණනය වී තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ සිට ලැබිය යුතු වෙළඳ සහ අනෙකුත් රු.1,184,931 ක ශේෂය අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සමාගම විසින් ගෙන නොතිබුණි.

(ඈ) සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් වෙත ගෙවන ලද පිළිවෙලින් රු.3,379,359 ක් සහ රු.1,037,081 ක් වූ අත්තිකාරම් 2013 වර්ෂයේ සිට පවතින නමුත් ඒවා අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සමාගම විසින් ගෙන නොතිබුණි.

(ඉ) සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල් සඳහා ගෙවිය යුතු රු.13,658,977 ක අධිභාර 2011 වර්ෂයේ සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) පැල්වත්ත සීනි කර්මාන්තායතනය විසින් ගොවියන්ට දෙනු ලබූ රු.592,468,478 ක ණය මුදල 1987 වර්ෂයේ සිට නිරවුල් නොවී පැවතුණි.

(උ) සෙවනගල සීනි කර්මාන්තායතනය විසින් ගොවියන්ට ලබා දී තිබූ රු.45,689,091 ක ණය ශේෂයන් අවුරුදු 2 සිට 6 දක්වා කාලයක් අය නොවී පැවතියද එම ශේෂයන් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සමාගම විසින් ගෙන නොතිබුණි.

## 1.5 තත්ත්වාගණනය කළ මතය

---

මගේ මතය, තත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2. වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමාකිරීම් 2.2 ඡේදයේදක්වා ඇති පරිදි වේ.

(ආ) මගේ මතය

- තත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගනනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**3. නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**-------------------------------------------------------------------------**

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවුනු අවස්ථා නිරීක්ෂණය විය.

| **නීතිරීති, රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 2007 අංක 07 දරන සමාගම් පනත | |
| (i) 131 වගන්තිය | වාර්ෂික වාර්තාවක් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමේ දින සිට වැඩ කරන දවස් 30 ක් ඇතුළත සමාගම් රෙජිස්ටාර්වරයා වෙත භාර දිය යුතු වුවද, සමාගම විසින් සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව පිළියෙල කර නොතිබුණි. |
| (ii) 133 වගන්තිය | එක් එක් වර්ෂයකට වරක් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ ශේෂ පත්‍ර දිනයේ සිට මාස හයකට වඩා පසු නොවන සහ පූර්ව වාර්ෂික රැස්වීමෙන් පසු මාස පහළොවකට වඩා පසු නොවන දිනක දී පැවැත්වීම සඳහා කොටස් හිමියන්ගේ වාර්ෂික රැස්වීමක් කැඳවනු ලැබිය යුතු වුවද සමාගම විසින් 2014 වර්ෂයෙන් පසුව එබඳු රැස්වීමක් පවත්වා නොතිබුණි. |

**4. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**4.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

**-------------------------------------**

2011 අගෝස්තු 11 දින 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරි වත්කම් පුනරුදය කිරීමේ පනත යටතේ පිහිටවනු ලැබූ සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ මෙහෙයුම් ඒකක දෙකක් ලෙස පැල්වත්ත සීනි සමාගම සහ සෙවනගල සීනි සමාගම ක්‍රියාත්මක වේ. මෙම සමාගමේ ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සෙවනගල සීනි සමාගමට අයත් උක් වගා කළ හැකි මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 4215 ක් වුවද, 2017 වර්ෂය වන විට සමාගමේ උක් වගා කර තිබූ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 3504 ක් විය. ඒ අනුව කර්මාන්තශාලාවේ මෙහෙයුම් උපරිම ධාරිතාවයෙන් යුක්තව පවත්වාගෙන යාමට අවශ්‍ය උක් සැපයුම ලබාගැනීමට ප්‍රමාණවත් ඉඩම් සමාගම සතුව තිබුණ ද එම ඉඩම් වගා කර කර්මාන්තශාලාවේ නිෂ්පාදනය ඉහළ දැමීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ආ) සෙවනගල සීනි සමාගමේ 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ වර්ෂ 06 ක කාලය සලකා බැලීමේදී හෙක්ටයාරයකට ලබාගෙන තිබූ උක් ඵලදාව ක්‍රමයෙන් අඩු වී තිබුණි. 2016 දී හෙක්ටයාරයකට උක් ඵලදාව මෙට්‍රික්ටොන් 86 ක් වුවද, 2017 වන විට මෙට්‍රික්ටොන් 69 දක්වා අඩු වී තිබුණි. එහෙත් මෙම තත්ත්වය වර්ධනය කර ගැනීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රවාහනය සඳහා වැඩි කාලයක් ගත වීමත්, කම්හල් ආපදා, උක් දඬුවල පවතින රොඩු හා අපද්‍රව්‍ය හේතුවෙන් සීනි නිපදවීමට යොදා ගන්නා උක් දඬුවල පවතින සීනි ප්‍රමාණය 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය වන විට පිළිවෙලින් පැල්වත්ත සීනි සමාගමේ උක් මෙට්‍රික් ටොන් එකකට සියයට 11.23 සිට 7.95 දක්වා ද, සෙවනගල සීනි සමාගමේ 7.95 සිට 7.62 දක්වා ද අඩු වී තිබුණි. එසේම එම උක් දඬුවල සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය වන විට පැල්වත්ත සීනි සමාගමේ පිළිවෙලින් සියයට 8.95 සිට 7.3 දක්වා ද, සෙවනගල සීනි සමාගමේ පිළිවෙලින් සියටට 8.01 සිට 7.67 දක්වා ද අඩු වී තිබුණි. එසේවුවද මෙම තත්ත්වයන් මඟහරවා ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඈ) උක් සැපයුම අඩු වීම හේතුවෙන් සමාගමේ උපරිම ධාරිතාවය වන උක් මෙට්‍රික් ටොන් 837,500 න් සියයට 35 ක්ම සමාලෝචිත වර්ෂයේදී භාවිතයට ගෙන නොතිබුණි. එබැවින් සමාගමේ සීනි නිෂ්පාදනය පෙර වර්ෂයේදී මෙට්‍රික් ටොන් 51,422 ක් වුවද, සමාලෝචිත වර්ෂය වන විට මෙට්‍රික් ටොන් 42,841 ක් දක්වා සියයට 17 කින් අඩු වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී සීනි නිෂ්පාදනය පහළ යාම නිසා එතනෝල් නිෂ්පාදනයේ ප්‍රධාන අමුද්‍රව්‍ය වන මොලෑසස් නිෂ්පාදනය අඩු වීම සහ එතනෝල් විකිණුම් ප්‍රමාණය අඩු වී තිබීමෙන් ස්ප්‍රීතු ගබඩා ටැංකි වැඩි කාලයක් පිරී පැවතීම නිසා පෙර වර්ෂයට සාපේක්ෂව එතනෝල් නිෂ්පාදනය බල්ක් ලීටර් 11,917,279 සිට 7,045,228 දක්වා සියයට 41 කින් අඩු වී තිබුණද, මෙම තත්ත්වය මඟහරවා ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඊ) සීනි නිෂ්පාදනය අඩු වීමෙන් එයින් ඉවතලන බැගැස් ආධාරයෙන් නිපද වූ බලශක්තිය පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය වන විට මෙගාවොට් පැය 16,346 සිට 12,534 දක්වා අඩු වී තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේදී විකල්ප බලශක්ති සඳහා අමතර පිරිවැයක් දැරීමට සමාගමට සිදුවී තිබුනද, මෙම තත්ත්වය කළමනාකරණය කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(උ) ඉඩම් සංවර්ධන අංශය සතු ට්‍රැක්ටර් රථ 43 න්, ට්‍රැක්ටර් රථ 29 ක් සමාලෝචිත වර්ෂය අවසානයේදී අළුත්වැඩියා කටයුතු සඳහා කෘෂිකාර්මික වැඩපල තුළ මාස 06 කට වැඩි කාලයක් රඳවා තැබීම හේතුවෙන් නිෂ්පාදන කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණද, එම ට්‍රැක්ටර් රථ කඩිනමින් අළුත්වැඩියා කර ඉඩම් සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඌ) වගා බිම් සකස් කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ කලට වේලාවට සැපයීමට කළමනාකරණය කටයුතු නොකිරීම නිසා සමාගමට අහිමි වූ ගණනය කරන ලද ආදායම හෙක්ටයාරයකට රු.409,950 කි.

(එ) උක් අස්වනු නෙලීම සඳහා ක්ෂේත්‍ර තෝරා ගැනීමේ දී, එක් එක් ක්ෂේත්‍රයෙන් ලබා ගන්නා උක් සාම්පල කර්මාන්තශාලා විද්‍යාගාර වෙත යවා සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය සම්බන්ධයෙන් ලබාදෙන නිරීක්ෂණ පදනම් කර ගනිමින් උක් අස්වැනු නෙලීම සමාගමේ සම්ප්‍රදායික ක්‍රමවේදය වුවද, පැල්වත්ත සීනි සමාගමේ 2017 මහ කන්නයේ උක් අස්වනු නෙලීමේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සමාගමෙහි හිටපු වැඩබලන සාමාන්‍යාධිකාරීවරයා විසින් එම සාම්ප්‍රදායික ක්‍රමවේදය අත්හිටුවා තිබුණි. ඒ අනුව සමාගමට අහිමි වී තිබූ ආදායම රු.159,559,000 ක් ලෙස කේන්ද්‍රීය වතු අංශයේ කළමණාකරු විසින් සහතික කර තිබුණි.

(ඒ) වසර 30 කට වඩා පැරණි පැල්වත්ත සීනි සමාගම අඛණ්ඩව මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා එකී නඩත්තු කටයුතු කලට වේලාවට සිදු කිරීම අරමුණින් අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා මිලට ගැනුම් අංශයේ පැවති සැලකිය යුතු ප්‍රමාදය හේතුවෙන් 2018 මාර්තු 31 දිනට පෙර අවසන් කළ යුතු නඩත්තු කටයුතු 2018 අප්‍රේල් මාසය අවසානය දක්වා අවසන් කර නොතිබීම නිසා මාසයකින් උක් ඇඹරීමේ කටයුතු ප්‍රමාද වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පැල්වත්ත සීනි සමාගමේ විමර්ශන අංශය වෙත සමාලෝචිත වර්ෂයේදී වාර්තාවී ඇති මුළු සිදුවීම් 104 න් විමර්ශන කටයුතු අවසන් කර තිබුණේ සිදුවීම් 36 ක පමණි. ප්‍රමාණවත් විමර්ශන නිලධාරීන් බඳවාගෙන විමර්ශනයන් අවසන් කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ආ) සමාගමේ නීති අංශය පරීක්ෂාවේදී සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වාර්තා වූ නඩු වලට අදාළ තොරතුරු හෝ කිසිදු ලිපිගොනුවක් ආයතනය සතුව නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී බඳවා ගත් නීති නිළධාරියා වෙත ඔහුගේ රාජකාරි නිසි පරිදි පවරා නීති අංශය විධිමත්ව සංවිධානය කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඇ) සෙවනගල සීනි සමාගමේ කාබන්ඩයොක්සයිඩ් නිපදවීමේ ව්‍යාපෘතිය පෞද්ගලික සමාගමක් වෙත 2014 වර්ෂයේදී පවරා දි තිබූ අතර ඒ සඳහා අවශ්‍ය භූමිය, විදුලිය, ජලය හා අනෙකුත් යටිතල පහසුකම් ද කිසිදු අයකිරීමකින් තොරව සමාගම විසින් ලබා දී තිබුණි. එසේම, එම කරුණු නොසලකා එම සමාගමට කාබන්ඩයොක්සයිඩ් කිලෝවක් රු.25 ක් වැනි වෙළඳපල මිලටත් වඩා අඩු මිලකට අලෙවි කිරීමට සමාගම කටයුතු කිරීමෙන් සමාගමේ සම්පත් භාවිතයෙන් පෞද්ගලික සමාගමකට වසර 20 ක් දක්වා ලාභ ලබා ගැනීමට සමාගම අවස්ථාව සලසා දී තිබුණද, එම මිල ගණන් සංශෝධනය කර සමාගමේ ආදායම වැඩිකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඈ) සෙවනගල සීනි සමාගමේ අපජලය පිරිපහදු කිරීමට අදාළ යන්ත්‍ර සවිකිරීම සඳහා රු.27,067,812 ක කොන්ත්‍රාත්තුවක් ලබාදී තිබූ අතර, එය 2014 මැයි මාසය වන විට නිම කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය නිම කිරීමට කළමනාකරණය කටයුතු නොකිරීම හේතුවෙන් කර්මාන්තශාලාව ලබාගත යුතු පරිසර ආරක්ෂණ බලපත්‍රය ද ලබා ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී රු.479,808 කට මිලදී ගෙන තිබූ ඉන්ධන නිකුත් කිරීමේ යන්ත්‍රය (fuel dispensing pump – electric ) මඟින් ඉන්ධන නිකුත් කිරීමේදී නිකුත් කළ ප්‍රමාණයට වඩා අඩුවෙන් නිකුත් වන හෙයින් 2018 ජනවාරි 23 දිනට ඩීසල් ලීටර 409 ක අතිරික්තයක්

පැවතුණද, යන්ත්‍රය අළුත්වැඩියා කර දීමට හෝ නව ඉන්ධන සැපයුම් යන්ත්‍රයක් ලබාදීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඊ) සෙවනගල සීනි සමාගමේ ප්‍රධාන ගබඩාවේ පැවති ඔක්සිජන් සිලින්ඩර් 66 න් සිලින්ඩර් 22 ක් අස්ථානගත වී තිබූ අතර ඒ පිළිබඳව පරීක්ෂණ පවත්වා වගකිවයුතු නිලධාරීන්ගෙන් අලාභ අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(උ) සෙවනගල සීනි සමාගමේ ප්‍රධාන ගබඩාවේ පැවති ඇසිටිලින් සිලින්ඩර තිබිය යුතු ප්‍රමාණයට වඩා 10 ක් අතිරික්තව පැවතුණි. සමාගම විසින් ගබඩා පොත්පත් නඩත්තු නොකිරීම නිසා මෙම අක්‍රමිකතා සිදුව තිබූ නමුත් මෙම තත්ත්වය කළමනාකරණය කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඌ) සෙවනගල සීනි සමාගමේ දුර්වල අභ්‍යන්තර පාලන ක්‍රමවේද හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ඇසිටිලින් සිලින්ඩර 26 ක පැවති ඇසිටිලින් වායුව අස්ථානගත වීම හේතුවෙන් සමාගමට සිදුව ඇති පාඩුව රු. 78,185 කි. මේ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන පාඩුව අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(එ) සාංගමික පාලන මාර්ගෝපදේශය "උපලේඛනය G" මගින් සමාගමේ ලේකම්ගේ කාර්යභාරය ලෙස අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ කටයුතු, වාර්තා පවත්වා ගැනීම ආදිය පිළිබඳ කටයුතු විස්තර කර ඇත. එසේ වුවද, සමාගමේ ලේකම්වරයා වෙත එම රාජකාරී පවරා නොතිබූ අතර එම කටයුතු ඉටු කරවා ගැනීමට වෙනත් නිළධාරියකු යොදවා තිබුණි.

### 4.3 නිෂ්කාර්ය සහ ඌන උපයෝජිත වත්කම්

2013 වර්ෂයේදී රු.128,910,000 ක වටිනාකමකට කල්බදු පහසුකම් යටතේ මිලටගත් ක්‍රේන් යන්ත්‍රය සැපයුම්කරු විසින් සමාගම එකඟ වූ පරිදි කර්මාන්තායතනය තුළ ස්ථාපිත නොකිරීම නිසා මිලට ගත් දිනයේ සිට කිසිදු ප්‍රයෝජනයක් ගත නොහැකි තත්ත්වයේ පැවතුණි. මෙම යන්ත්‍රය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සමාගම විසින් ගෙවා ඇති කල්බදු වාරිකවල වටිනාකම සහ පොලිය රු.21,734,748 ක් වූ අතර, තවදුරටත් ඉදිරි වසර 02 ක් දක්වා පොලිය සහිතව ගෙවිය යුතු මුළු වාරික මුදල රු.27,168,660 ක් බැවින් මෙය නිෂ්කාර්ය වියදමක් බවට නිරීක්ෂණය විය.

### 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාගම විසින් බඳවා ගැනීමේ පරිපාටියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර කාර්යය මණ්ඩලයක් නිශ්චිතව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබූ අතර සමාගමේ ප්‍රධාන කාර්යාලයේ කළමනාකරණ මට්ටමේ නිලධාරීන් 8 දෙනෙකු කෙටිකාලීන කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන එම පත්වීම් නැවත දීර්ඝ කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 විගණන කමිටු

සමාගම විසින් විගණන කමිටුවක් පත් කර තිබියදීත් එම කමිටුව විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්වීම හා වාර්ෂික වාර්තා සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවීම් ආදි කටයුතුවලදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පෙන්වා දී නොතිබුණ හෙයින් එම කටයුතු කලට වේලාවට ඉටුවී නොතිබුණි.

### 5.2 පරිසර විගණනය

කර්මාන්තශාලාවෙන් පිටවන අප ජලය පිරිපහදු කිරීමේ ඒකකය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සම්පූර්ණ කර නොතිබූ අතර එම අප ජලය පරිසරයට මුදාහැරීමෙන් සිදුවන පරිසර හානිය අවම කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

2016 විගණකාධිපති වාර්තාවේ 4.1(අ) (i) ඡේදය පරිදි රු.28,163,089 ක වියදමක් දරා නවීකරණය කරන ලද සමාජ ශාලාව හා ආගන්තුක නිවස දැරූ පිරිවැයට සරිලන ප්‍රතිලාභ අත්කර ගැනීමට නොහැකිවීම.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව සමාගමේ සභාපති වෙත වරින්වර අවධානය යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | මානව සම්පත් කළමනාකරණය | අනුමත බඳවාගැනීමේ පරිපාටියක් සකස් කර නිශ්චිත කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුගමනය කර ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතුය. |